# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය පිළිබඳ අධ්‍යයනය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය පිළිබඳ අධ්‍යයනය

## 2016

පුස්තකාල පර්යේෂණ අංශය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# පෙරවදන

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට පැවරෙන ප්‍රධාන වගකීමකි. රට තුළ ප්‍රකාශයට පත්වන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් නිල ලේඛනය ජාතික ග්‍රන්ථ නාමාවලිය වේ. පුස්තකාලවල ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය වර්ධනය කිරීම සඳහා මණ්ඩලය විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එම ක්‍රියාමාර්ග තුළින් ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ පුස්තකාලවල ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ වත්මන් තත්වය අවබෝධ කර ගැනීමයි. මෙම අධ්‍යයනය තුළින් ජාතික ග්‍රන්ථ නාමාවලියේ භාවිතය කෙරෙහි බලපා ඇති බාධාවන්, එය භාවිත කරන ආකාරය ආදී කරුණු පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි වී ඇත. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය හා ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීමට මෙම අධ්‍යයනය බෙහෙවින් ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කරමි.

ආචාර්ය ඩබ්ලියු .ඒ. අබේසිංහ
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ශ්‍රී ලංකාවේ පළවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් එකම නිල ලේඛනය වේ. ජාතික ග්‍රන්ථ නාමාවලිය දැනට මාසික කලාපයක් වශයෙන් සම්පාදනය කරනු ලබන අතර අදාළ කාලය තුළ පළ වූ නවතම ග්‍රන්ථ පිළිබඳ තොරතුරු හා ඉදිරියේ පළවීමට නියමිත ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පුස්තකාලයාධිපතිවරුන්ට පමණක් නොව පර්යේෂකයින්ට විද්වතුන්ට මෙන්ම සාමාන්‍ය පාඨකයින්ටද ප්‍රයෝජනවත් මූලාශ්‍රයකි. ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය පිළිබඳ මෙතෙක් අධ්‍යයනයක් සිදු වී නොතිබීම විශාල අඩුපාඩුවක්ව පැවති අතර මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ වත්මන් තත්වය පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන්ගේ ආකල්ප අවබෝධ කර ගැනීමයි. ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ දැනුවත්භාවය, ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගන්නා මාර්ග, ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා නොගැනීමට හේතු, ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා ගැනීමේ අරමුණු, ජාතික ග්‍රන්ථ නාමාවලියේ අන්තර්ගතය හා නිමාව වැනි කරුණු මෙම අධ්‍යයනය මගින් ආවරණය කරන ලදී. ජාතික ග්‍රන්ථ නාමාවලියේ ඉදිරි සංවර්ධනය සඳහා මෙම අධ්‍යයනය බෙහෙවින් ඉවහල් වනු ඇතැයි විශ්වාස කරමි. මෙම අධ්‍යයනය සිදුකිරීම සම්බන්ධයෙන් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජී.ඩී. අමරසිරි මහතා, කමලාංගනි සුබසිංහ මහත්මිය ඇතුළු පුස්තකාල පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

ඩබ්ලිව්. සුනිල්
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

# පටුන

පිටුව


| | |
|---|---|
| හැඳින්වීම | 1 |
| අධ්‍යයනයේ අරමුණ | 1 |
| ක්‍රම විද්‍යාව | 2 |
| අධ්‍යයනයේ වැදගත්කම | 2 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ දැනුවත්භාවය | 2 |
| පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගැනීම | 3 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගන්නා ක්‍රමය | 3 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා නොගැනීමට හේතු | 4 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගෙන ඇති කාල සීමාව | 4 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගැනීමේ අවශ්‍යතා | 5 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ප්‍රයෝජනවත්භාවය | 5 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ අන්තර්ගතය | 6 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ නිමාව | 6 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ අඩුපාඩු පිළිබඳ පුස්තකාලයාධිපතිවරුන්ගේ අදහස් | 7 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම සඳහා අදහස් හා යෝජනා | 8 |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය දැනට පවතින මුද්‍රිත ප්‍රකාශනයට අමතරව විද්‍යුත් මාධ්‍යයෙන් (CD ) සම්පාදනය කිරීම පිළිබඳ අදහස් | 9 |
| නිගමන | 10 |
| නිර්දේශ | 10 |

# ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය පිළිබඳ අධ්‍යයනය

## හැඳින්වීම

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට පැවරෙන ප්‍රධාන වගකීමකි. එය ඕනෑම රටක ජාතික පුස්තකාලයකට පැවරෙන වගකීමකි. රටතුළ පළවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබාදෙන නිල ප්‍රකාශනය ජාතික ග්‍රන්ථ නාමාවලිය වේ. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද්දේ 1962 වර්ෂයේදීය. ඉන් පසු 1973 වර්ෂයේ දී එහි සම්පාදනය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට පැවරිණි. දැනට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය සිංහල , දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනෙන් ත්‍රෛභාෂික ප්‍රකාශනයක් ලෙස මාසිකව සම්පාදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය විශේෂයෙන් පුස්තකාලයාධිපතිවරුන්ට වැදගත්වන මූලාශ්‍රයකි. පුස්තකාලවලට පොත් තෝරාගැනීමේදී නවතම ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබාගැනීමට ජාතික ග්‍රන්ථනාමාවලිය උපයෝගී කරගත හැකිය. කෙසේවුවද පුස්තකාලයාධිපතිවරුන් අතර ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය අඩු මට්ටමක පැවතීම පසුගිය කාලය තුළ හඳුනාගත් ගැටලුවකි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය භාවිතය අඩුවීම එහි අපේක්ෂිත ප්‍රතිඵලය ලබාගැනීමට බාධාවක් ලෙස පවතින බව පෙනීගොස් ඇත. ජාතික ග්‍රන්ථ නාමාවලිය භාවිතය අඩුවීම කෙරෙහි හේතු ගණනාවක් බලපාන බව උපකල්පනය කළ හැකිය. ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ නොදැනුවත්භාවය, එය ලබාගැනීමට පුස්තකාලයාධිපතිවරු අතර උනන්දුවක් නොමැති වීම, ආයතන ප්‍රධානීන් මේ කෙරෙහි උනන්දුවක් නොදැක්වීම, මුදල් ප්‍රතිපාදන ලබා ගැනිමේ ගැටලු ආදිය මේ කෙරෙහි බලපෑ හැකි හේතු කිහිපයකි. මෙම හේතුව නිසා මේ සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදු කිරීම සුදුසු බව ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය තීරණය කරන ලදී.

## අධ්‍යයනයේ අරමුණ

1) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය පිළිබඳ පුස්තකාලයාධිපතිවරුන්ගේ දැනුවත් භාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.

2) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය ලබා නොගන්නා පුස්තකාල එසේ ලබා නොගැනීමට හේතු අවබෝධ කර ගැනීම.

3) පුස්තකාලයාධිපතිවරුන්ට ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ඇති ප්‍රයෝජන පිළිබඳ අවබෝධයක් ලබා දීම.

4) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමවලියේ අන්තර්ගතය පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන්ගේ ආකල්ප අවබෝධ කරගැනීම.

5) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ගුණාත්මකභාවය හා අඩුපාඩු පිළිබඳව පුස්තකාලයාධිපතිවරුන්ගේ ආකල්ප අවබෝධ කර ගැනීම.

6) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ගුණාත්මකභාවය හා භාවිතය වර්ධනය කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## ක්‍රම විද්‍යාව

මෙම අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලී ක්‍රමය යොදාගන්නා ලදී. මහජන, පාසල්, පිරිවෙන්, විශේෂ හා විශ්වවිද්‍යාල ආදී සෑම වර්ගයකම පුස්තකාල සඳහා ප්‍රශ්නාවලී යොමු කරන ලදී. යවනලද මුළු ප්‍රශ්නාවලී සංඛ්‍යාව 500 කි. පිළිතුරු වශයෙන් සම්පූර්ණ කරන ලද ප්‍රශ්නාවලී 200 ක් ලැබිණි. පිළිතුරු ලැබුණු පුස්තකාල 200 පර්යේෂණ නියැදිය වශයෙන් යොදා ගන්නා ලදී.


## අධ්‍යයනයේ වැදගත්කම

ජාතික ග්‍රන්ථ නාමාවලිය යනු ඕනෑම රටක පළවන ප්‍රකාශන පිළිබඳ තොරතුරු ඇතුළත් නිල ලේඛනය වේ. එබැවින් මෙය ජාතික වැදගත්කමකින් යුත් ප්‍රකාශනයකි. මෙම ලේඛනය සම්පාදනය කිරීම ලෝකයේ ඕනෑම රටක ජාතික පුස්තකාලයට පැවරෙන වගකීමකි. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ අධ්‍යයනයක් මෙතෙක් සිදුකර නොතිබීමද මෙම අධ්‍යයනයේ වැදගත්කම වැඩිවීමට ,තවත් හේතුවකි. ජාතික ග්‍රන්ථ නාමාවලියේ ගුණාත්මක භාවය වර්ධනය කර එය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමට මෙවැනි අධ්‍යයන ඉතා වැදගත් වේ. මෙම අධ්‍යයනය මඟින් ඉදිරිපත් කර ඇති නිර්දේශ හා සොයාගැනීම් ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීමේදී ඉතා වැදගත් වේ.

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථනාමාවලිය පිළිබඳ දැනුවත්භාවය

පුස්තකාලයාධිපතිවරුන් අතර ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ දැනුවත්භාවය ප්‍රමාණවත් නොවීම ගැටළුවක්ව පවතී. මෙම දැනුවත්භාවය වර්ධනය කිරීමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කර ඇතත් තවමත් එය ප්‍රමාණවත් නොවීම ගැටළුවක්ව පවතී. මෙම අධ්‍යයනයේදී ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ පුස්තකාලයාධිපතිවරුන් අතර ඇති දැනුවත්භාවය විමසා බලන ලදී. එහිදී ලබාදුන් පිළිතුරු පහත වගුවෙන් දැක්වේ.


| දැනුවත්භාවය | පුස්තකාලයාධිපතිවරු සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ දැනුවත් | 185 | 92.5% |
| ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ නොදැනුවත් | 15 | 7.5% |
| එකතුව | 200 | 100% |




රූප සටහන 01

## පුස්තකාල සඳහා ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගැනීම


පුස්තකාලය සඳහා ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගැනීම අඩු මට්ටමක තිබීම පසුගිය වසර ගණනාව තුළ ගැටලුවක් ව පැවතිණි. මේ පිළිබඳ පුස්තකාලයාධිපතිවරුන් දැනුවත් කර ජාතික ග්‍රන්ථ නාමාවලිය පුස්තකාල සඳහා ලබාගැනීම වර්ධනය කිරීම සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය කටයුතු කර ඇත. අධ්‍යයනය කරන ලද පුස්තකාල අතරින් වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගනී.




රූප සටහන 02

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගන්නා ක්‍රමය


විවිධ පුස්තකාල විවිධ ආකාරයෙන් ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගනු ලැබේ. මිලදී ගැනීම, දායකත්වය ලබාගැනීම, පරිත්‍යාග වශයෙන් ලබාගැනීම, හුවමාරු ක්‍රමය ආදිය මෙසේ ලබාගන්නා ක්‍රම වේ. සමීක්ෂණයට අනුව වැඩිම පුස්තකාල සංඛ්‍යාවක් (28% ) ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගනු ලබන්නේ අත්පිට මුදලට මිලදී ගැනීම මගිනි.




රූප සටහන 03

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා නොගැනීමට හේතු


ශ්‍රී ලංකාවේ පුස්තකාල සැලකිය යුතු ප්‍රමාණයක් ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා නොගනී. ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා නොගැනීමට විවිධ හේතු බලපා ඇත. මුදල් ප්‍රතිපාදනවල හිඟතාවය, ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගන්නා ආකාරය පිළිබඳ අනවබෝධය, පුස්තකාල සම්පත් තෝරාගැනීමට වෙනත් මූලාශ්‍ර භාවිත කිරීම, ප්‍රධාන පුස්තකාලය පමණක් මිලදී ගැනීම ප්‍රමාණවත් වීම වැනි හේතු මේ කෙරෙහි බලපා ඇත.




රූප සටහන 04

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගෙන ඇති කාල සීමාව


සමහර පුස්තකාල දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලි දායකත්වය පවත්වාගෙන යනු ලබයි. සමහර පුස්තකාල මෑතකදී දායකත්වය ලබාගත් පුස්තකාල වේ. මෙම අධ්‍යයනයේදී විවිධ පුස්තකාල ජාතික ග්‍රන්ථ නාමාවලී දායකත්වය ලබාගෙන ඇති කාල සීමාවන් අධ්‍යයනට භාජනය කරන ලදී. එහිදී අනාවරණය වූ කාල සීමාවන් පහත සඳහන් පරිදි වේ.




රූප සටහන 05

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගැනීමේ අවශ්‍යතා


ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ප්‍රයෝජන ගණනාවකි. ප්‍රධානම ප්‍රයෝජනය නම් අලුතින් ප්‍රකාශයට පත්වන ප්‍රකාශන පිළිබඳ තොරතුරු පාඨකයින්ට ලබාගත හැකි වීමයි. එමෙන්ම පුස්තකාල සඳහා පොත් තෝරාගැනීමේ මූලාශ්‍රයක් වශයෙන් ද මෙය පුස්තකාලයාධිපතිවරුන්ට ඉතා ප්‍රයෝජනවත් වේ. එමෙන්ම ජාතික ග්‍රන්ථ නාමාවලිය යනු රටතුළ පළවන ප්‍රකාශන පිළිබඳ නිල ලේඛනය වේ. මෙම අධ්‍යයනයේදී ජාතික ග්‍රන්ථ නාමාවලියේ ප්‍රයෝජන පිළිබඳ පහත සඳහන් කරුණු අනාවරණය විය.




රූප සටහන 06

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ප්‍රයෝජනවත්භාවය


ජාතික ග්‍රන්ථ නාමාවලියේ ප්‍රයෝජන ගණනාවකි. පුස්තකාලවලට පොත් තෝරා ගැනීම සඳහා යොදාගත හැකිවීම, රටතුළ පලවන නව ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබාගත හැකි මූලාශ්‍රයක් ලෙස යොදා ගැනීම, පුස්තකාලවල පොත් වර්ගීකරණය සඳහා යොදා ගැනීම එවැනි ප්‍රයෝජන කිහිපයකි. මෙම අධ්‍යයනයට භාජනය කරන ලද පුස්තකාල අතරින් වැඩි ප්‍රමාණයක් එනම්, පුස්තකාල 102ක් (51%) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ඉතා ප්‍රයෝජනවත් බව සඳහන් කර ඇත. පුස්තකාල 67 ක් ප්‍රයෝජනවත් බවත් පුස්තකාල 07ක් තරමක් ප්‍රයෝජනවත් බවත් සඳහන් කර ඇත. ඒ අනුව අධ්‍යයනයට භාජනය කරන ලද පුස්තකාල 200න් 176 ක් (88%) සඳහාම ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රයෝජනවත් වේ.




රූප සටහන 07

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ අන්තර්ගතය


අධ්‍යයනය සඳහා භාජනය කළ පුස්තකාල අතරින් වැඩි ප්‍රමාණයක් (55%) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ අන්තර්ගතය පිළිබඳව සතුටුදායක වියහැකි බව සඳහන් කර ඇත. 29% ක ප්‍රමාණයක් එය ඉතා සතුටුදායක බව සඳහන් කර ඇත. ඒ අනුව අධ්‍යයනයට භාජනය කළ පුස්තකාල අතරින් 84%ක්ම එහි අන්තර්ගතය පිළබඳව සෑහීමකට පත්වේ.




රූප සටහන 08

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ නිමාව

අධ්‍යයනය සඳහා භාජනය කළ පුස්තකාල අතරින් වැඩි ප්‍රමාණයක් (64%) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ නිමාව පිළිබඳව සතුටුදායක වියහැකි බව සඳහන් කර ඇත. 21% ක ප්‍රමාණයක් එය ඉතා සතුටුදායක බව සඳහන් කර ඇත. ඒ අනුව අධ්‍යයනයට භාජනය කළ පුස්තකාල අතරින් 85%ක්ම එහි නිමාව පිළිබඳව සෑහීමකට පත්වේ.




රූප සටහන 09

## ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ අඩුපාඩු පිළිබඳ පුස්තකාලයාධිපතිවරුන්ගේ අදහස්

### අන්තර්ගතය

1. බොහෝ පොත් සාප්පුවල ඇති පොත් පිළිබඳ විස්තර ජාතික ග්‍රන්ථ නාමාවලියේ ඇතුළත් නොවීම.

2. ජාතික පුස්තකාලයේ ඇති පොත්වල තොරතුරු පමණක් ඇතුළත් වී තිබෙන නමුත් ගම්බද ප්‍රදේශවල ලේඛකයින්ගේ පොත් පිළිබඳව ඇතුළත් නොවේ.

3. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ප්‍රකාශන පිළිබඳව දත්ත නොමැති වීම.

4. සිතියම්, වෙළෙඳ නාමාවලි ආදි ඇතැම් ප්‍රකාශන ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් නොවීම.

5. පොත් සඳහා වර්ගීකරණ අංක ලබාදීමේදී පිටු 49 ට වඩා කුඩා පොත් සඳහා අංක ලබා නොදීම.

6. ඇතැම්විට සූචි කාඩ්වල ඇති ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරුවල වැරදි දක්නට ලැබීම.

7. මහජන පුස්තකාල විශාල ප්‍රමාණයක් පොත් වර්ග කිරීමේ දී ඩීවි 21 භාවිතා කරන අතර ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේදී ඩීවි 23 මගින් අංක යොදා ඇති බැවින් සමහර ග්‍රන්ථවල තොරතුරු වෙනස් වේ. එම නිසා ඩීවි 23 හි ද සිංහල සංස්කරණයක් නිකුත් කිරීම සුදුසු වේ.

8. කලාපයට අදාල පොත් පිළිබඳ සාරාංශයක් නොතිබීම.

9. ප්‍රකාශන පූර්ව ග්‍රන්ථ නාමාවලියෙහි ඇතුළත් ග්‍රන්ථ පිළිබඳ හැඳින්වීමක් නොමැති වීම.

10. ග්‍රන්ථ නාමාවලිය පරිහරණය පිළිබඳව උපදෙස් ග්‍රන්ථයේ ඇතුළත් නොවීම.

11. පටුන පිටුවක් නොතිබීම.

12. කර්තෘ, ග්‍රන්ථ නාම හා ග්‍රන්ථමාලා අනුක්‍රමණිකාව එකට සකස් කර තිබීම.

### නිමාව

13. අකුරුවල ප්‍රමාණය කුඩාය.

14. දෙමළ මාධ්‍යයේ ප්‍රකාශනවල අකුරුවල ප්‍රමාණය කුඩා බැවින් තරමක් අපහැදිලිය.

15. නිමාව ආකර්ශනීය නොවීම.

16. මුද්‍රණ කටයුතු ප්‍රමාද වීම.

17. මාසිකව ප්‍රකාශයට පත් කළත් ප්‍රමාදවී ලැබීමෙන් ප්‍රයෝජනය අඩු වීම.

18. ප්‍රකාශනය ලැබීම ප්‍රමාදවීම නිසා ඒ මගින් තොරතුරු ලබාගෙන ග්‍රන්ථ මිලදී ගැනීමේ දී අපහසුතාවයට පත්වේ.

### වෙනත්

19. ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ බොහෝ පුස්තකාල වෘත්තිකයන්ගේ දැනුවත්භාවය අඩුවීම.

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම සඳහා අදහස් හා යෝජනා**

**අන්තර්ගතය**

1. ජනතාවට ග්‍රන්ථ නාමාවලිය ගැන සරල අවබෝධයක් ලබා ගැනීමට ඡේදයක් ඇතුළත් කිරීම.
2. නව කෘති හඳුන්වාදීමේදී මුද්‍රිත කවරයේ පින්තූරයක් දැමීම ප්‍රයෝජනවත් වේ.
3. යම්කිසි ප්‍රකාශකයෙකු හෝ ආයතනයක් විසින් ප්‍රකාශිත කෘති වෙන වෙනම ඇතුළත් කළ හැකි නම් ඉතා වැදගත් වේ.
4. ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියේ කර්තෘ, ග්‍රන්ථ නාම හා ග්‍රන්ථමාලා අනුක්‍රමණිකාව තවත් විධිමත් අයුරින් සකස් කළ යුතුය.
5. පුස්තකාල විද්‍යාව පිළිබඳ කරුණු නොදන්නා අය සඳහා පහසුවෙන් විෂය හඳුනාගැනීමට පහසු අයුරින් සකස් කිරීම.
6. එක් එක් භාෂාවන් සඳහා වෙන් වෙන් වශයෙන් වෙළුම් ඉදිරිපත් කිරීම.
7. විෂය ශීර්ෂ තදකළ අකුරෙන් (bold) යෙදීම.
8. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සැපයීමේදී මූලික පද (key word ) ලබා දෙන්නේ නම් එය පොත් තේරීමේදී පහසු වනු ඇත.
9. ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු සමඟ ග්‍රන්ථය පිළිබඳ කෙටි හැඳින්වීමක් ලබා දීම.
10. ග්‍රන්ථ නාමාවලියේ කර්තෘ ප්‍රකාශන මිලදී ගත හැකි ස්ථානය දක්වන්නේ නම් ඒවා මිලදී ගැනීම පහසුවීම.
11. සූචිකරණ දත්ත නිවැරදි ආකාරයෙන් ඉදිරිපත් කිරීම.
12. ශබ්ද කෝෂයක ආකාරයට සකස් කරන්නේ නම් තොරතුරු සොයා ගැනීම පහසුය.
13. ප්‍රකාශකයින්ගේ හා කර්තෘවරුන්ගේ විස්තර ඇමුණුමක් ලෙස ඉදිරිපත් කිරීම.
14. වර්ග කරන කාණ්ඩ ඉතා පැහැදිලිව හඳුනා ගැනීම සඳහා විවිධ වර්ණයෙන් මුද්‍රණය කිරීම.
15. ශ්‍රී ලංකාව තුළ පළකරන සියලුම පොත් ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් කිරීම.
16. ග්‍රන්ථ නාමාවලියේ දායකත්වය ලබාගත් පුස්තකාලවල නාමලේඛනයක් ඉදිරිපත් කිරීම.
17. ග්‍රන්ථ නාමාවලිය ප්‍රකාශයට පත් වූ පසු පුස්තකාලවලට ඒ පිළිබඳ දැනුවත් කිරීම.
18. පොතෙහි පිටකවරයේ ඡයාරූපයක් ඇතුළත් කරන්නේ නම් පාඨකයාට පහසු වේ.

**නිමාව**

20. වසර 50 ක් ගතවී ඇති බැවින් පිටකවරයේ වර්ණයේ වෙනසක් සිදු කිරීම සුදුසු වේ.

21. දැනට යොදන පිටකවරයට වඩා ශක්තිමත් පිටකවරයක් යෙදීමෙන් හොඳ නිමාවක් ලැබේ.

22. විචිත්‍රවත් හා ආකර්ශනීය ලෙස ඉදිරිපත් කිරීම.

23. සිංහල අක්ෂරයන්හි ව්‍යාකරණ සදොස් තැන් නිදොස් කිරීම සුදුසු වේ.

**වෙනත්**

24. නියමිත දිනට ප්‍රකාශයට පත් කිරීම.

25. මුදල් ගෙවා තිබුණද නියමිත කාලයට නොලැබීම නිසා ඉන් ප්‍රයෝජන ගත නොහැකි වීම.

26. වර්ෂයකට එක් ප්‍රකාශනයක් අමතරව නිකුත් කල හැකි නම් එය වඩාත් ප්‍රයෝජනවත් වේ.

27. ග්‍රන්ථ නාමාවලිය ලබාගැනීම සඳහා අයදුම් කළයුතු අයදුම් පත්‍ර සෑම වර්ෂයකම පුස්තකාලවලට ලැබෙන්නට සැලැස්වීම.

28. නියමිත කාල පරිච්ඡේදය තුළම ග්‍රන්ථ නාමාවලීන් ලබාදීමට කටයුතු කිරීම.

29. මිලදී ගැනීමට නොහැකි මහජන පුස්තකාල සඳහා නොමිලයේ බෙදා දීම.

30. සියලුම දිස්ත්‍රික්කවල මධ්‍ය පුස්තකාල තෝරා නොමිලේ ලබාදීම.

31. විදේශීය පොත්පත් පිළිබඳ ග්‍රන්ථ නාමාවලියක් සකස් කිරීම.

32. ජාතික ග්‍රන්ථනාමාවලියකින් ඉටු වන මෙහෙය හා එහි වැදගත්කම පිළිබඳව ජනතාව මෙන් ගවේෂකයින්, පර්යේෂකයින්, විද්‍යාර්ථීන් හා ග්‍රන්ථ ප්‍රකාශකයන් තුළ ද අවබෝධයක් ඇති කිරීම.

33. නව තාක්ෂණයට අනුගත වීම.

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය දැනට පවතින මුද්‍රිත ප්‍රකාශනයට අමතරව විද්‍යුත් මාධ්‍යයෙන් (CD ) සම්පාදනය කිරිම පිළිබඳ අදහස්**

**වාසි**

1. මුද්‍රිත ප්‍රකාශන කාලයක් පුරා පවත්වාගෙන යාමේදී විශාල ඉඩක් අවශ්‍ය වීම.

2. ප්‍රකාශන රාශියක් අධ්‍යයනය කරනවාට වඩා කාර්යක්ෂමව කළ හැකි වීම.

3. වසර ගණනාවක් පැරණි වීමේදී මුද්‍රිත ප්‍රකාශන කාවන් වැනි සතුන්ගෙන් විනාශ වීම.

4. තොරතුරු ගවේෂකයන්හට මහත් පිටුවහලක් වේ.

5. ඉක්මණින් හා පහසුවෙන් තොරතුරු සොයාගත හැකිවීම.

6. විද්‍යුත් මාධ්‍යයෙන් සම්පාදනය කිරීම ඉතාමත් යෝග්‍ය වන අතර කාලෝචිත වේ.

7. භාවිතය පහසුවීම.

8. වෙබ් අඩවිය මඟින් ගවේෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්නේ නම් ඉතා වැදගත් වේ.

9. දැනට ප්‍රකාශනය ලැබීමට ප්‍රමාද වීම නිසා විද්‍යුත් මාධ්‍යයෙන් සම්පාදනය කිරීම යෝග්‍ය වේ.

10. මුද්‍රිත ප්‍රකාශන නිතර පරිහරණය වීම තුළින් හානි සිදුවිය හැකි වීම.

11. ඉඩ පහසුකම් සීමිත පුස්තකාල සඳහා ප්‍රයෝජනවත් වේ.

12. පැරණි ග්‍රන්ථ නාමාවලී ඉවත් කිරීමේදී මතුවන ගැටළු මඟ හරවා ගැනීම සඳහා මාර්ගගත ප්‍රකාශනයක් ලෙස ලබාදීම වැදගත් වේ.

13. අඩු පිරිවැයක් යටතේ පරිශීලනය කිරීම ඉතා සුදුසුය.

14. ඉක්මණින් හා පහසුවෙන් නව ප්‍රකාශන පිළිබඳ දැනුවත් වීම සඳහා මාර්ගගත ප්‍රවේශය වැදගත් වේ.

15. සංයුක්ත තැටි මඟින් තැටි කිහිපයකට පිටපත් කර හුවමාරු කර ගැනීමේ හැකියාව තිබීම.

16. දත්ත බාගත (download) කරගත හැකිවන ආකාරයෙන් අන්තර්ජාලයට ඇතුළත් කිරීම.

17. විද්‍යුත් මාධ්‍ය හරහා ලබා ගැනීමේ දී ගාස්තු අයකිරීමක් සිදුවන්නේ නම් සාධාරණ මිලක් තීරණය කිරීම.

18. ජාතික පුස්තකාල වෙබ් පිටුවට ඇතුළත් කිරීමට කටයුතු කිරීම වඩා පහසුවේ.

19. මාර්ගගත ප්‍රකාශනයක් ලෙස සකස් කිරීම තුළින් ජාත්‍යන්තර තලයට ගෙනයාමේ හැකියාවක් ඇත.

20. ඕනෑම ස්ථානයක සිට අදාල තොරතුර වෙත පහසුවෙන් ප්‍රවේශවීමට හැකියාව ලැබේ.

21. සංයුක්ත තැටිය රැගෙන යාමේ පහසුව.

22. අධ්‍යයන කටයුතු සඳහා ද, පුස්තකාල සංවර්ධන කටයුතු සඳහා ද කාර්ය මණ්ඩල දැනුවත්වීම සඳහාද ඉතාමත් අගය කළයුතු ක්‍රියාදාමයකි.

**අවාසි**

23. විදුලිය නොමැති අවස්ථාවක විද්‍යුත් මාධ්‍ය පරිහරණය කළ නොහැකි වීම.

24. පරිගණක ඇති පුස්තකාලවලට පමණක් වැදගත් වීම.

25. සෑම පුස්තකාලයකම පරිගණක නොමැති වීම හා ඒවායේ තොරතුරු සෙවීම සඳහා වෙනම පුද්ගලයෙකු පුහුණුකළ යුතු වීම.

## නිගමන

1) අධ්‍යයනයට භාජනය කරන ලද පුස්තකාලයාධිපතිවරුන් ගෙන් වැඩි ප්‍රමාණයක් (92%) ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳව දැනුවත් ය.

2) අධ්‍යයනට භාජනය කරන ලද පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (57%) ක් ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගනී.

3) ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගන්නා පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (28%) එය ලබාගනුයේ මිලදී ගැනීම මගිනි.

4) ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා නොගන්නා පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (12% ) ක් එය ලබා නොගැනීමට හේතුව වශයෙන් දක්වා ඇත්තේ මුදල් ප්‍රතිපාදන හිඟතාවයයි.

5) ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබා ගන්නා පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (23%) එය ලබා ගන්නා කාලසීමාව වසර දහයකට වැඩිය.

6) ජාතික ග්‍රන්ථ නාමාවලිය ලබාගන්නා පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් එය ලබා ගැනීමේ අවශ්‍යතාවය වශයෙන් දක්වා ඇත්තේ නව ප්‍රකාශන පිළිබඳ තොරතුරු ලබා ගැනීමයි.

7) අධ්‍යයනයට භාජනය කරන ලද පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (51%) ජාතික ග්‍රන්ථ නාමාවලිය ප්‍රයෝජනවත් මූලාශ්‍රයක් බව දක්වා ඇත.

8) අධ්‍යයනයට භාජනය කරන ලද පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (55%) ජාතික ග්‍රන්ථ නාමාවලියේ අන්තර්ගතය සතුටුදායක බව දක්වා ඇත.

9) අධ්‍යයනයට භාජනය කරන ලද පුස්තකාලවලින් වැඩි ප්‍රමාණයක් (64%) ජාතික ග්‍රන්ථ නාමාවලියේ නිමාව සතුටුදායක බව සඳහන් කර ඇත.

## නිර්දේශ

1) ජාතික ග්‍රන්ථ නාමාවලිය හැකිතාක් දුරට යාවත්කාලීනව පවත්වාගෙන යාම.

2) ජාතික ග්‍රන්ථ නාමාවලියේ ආවරණය හැකිතාක්දුරට පුළුල් කිරීම.

3) ජාතික ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ පුස්තකාලවල දැනුවත්භාවය වර්ධනය කිරීම.

4) ජාතික ග්‍රන්ථ නාමාවලිය සංයුක්ත තැටියක් වශයෙන් සම්පාදනය කිරීම.

5) ජාතික ග්‍රන්ථ නාමාවලිය අන්තර්ජාලයෙන් ගවේශනය කළ හැකි පරිදි පහසුකම් සැලසීම.

National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/24

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R. Gumage

Signature : [signature]

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Irani Wijesundara

Signature : [signature]

Date : 2017/10/24

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*